din-06-25-3p-27x3-akw

WC - 340

# ප්‍රසම්පාදන දැන්වීම

**01 KW හා 02 KW ශුද්ධ මනුකරණ සූර්ය බල පද්ධති සැපයීම**

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බද්දේගම

01. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති වන මා විසින් **බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෞද්ධ විහාරස්ථාන 06 ක් වෙනුවෙන් ජාලගත ශුද්ධ මනුකරණ සූර්ය බල පද්ධති 06 ක් සැලසුම්කර ප්‍රවාහනය කර සපයා, ස්ථානගත කර, ක්‍රියාත්මක කර, නඩත්තුව සමගින් පවත්වා ගෙන යාමට** සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2019.07.12 වන දින ප.ව. 2.30 දක්වා මුද්‍රා තැබූ ලංසු මෙයින් කැඳවනු ලැබේ.

02. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ බලපවත්වනු ලැබේ.

03. ලංසුකරුවන් විසින් ලංසු භාරගන්නා අවසාන දිනට හෝ ඉන් පෙර "**සූර්ය බල සංග්‍රාමය**" සඳහා වන ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ (SLSEA) වෙතින් වලංගු ලියාපදිංචිය ලබාගෙන තිබිය යුතුය.

04. ලංසුකරුවන් ආපසු නොගෙවන **රු. 2,500/-** ක ලංසු තැන්පත් මුදල බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදල් ගෙවා ලබාගන්නා කුවිතාන්සිය හා ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බද්දේගම යන ලිපිනයට ව්‍යාපාර ලිපි ශීර්ෂයක ලියන ලද ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් **2019.06.28** දින සිට **2019.07.11** දින **ප.ව. 3.00** දක්වා කාර්යාල වේලාවන්හිදී, මෙම කාර්යාලයේ ගිණුම් අංශයෙන් ලංසු ලියවිලි ලබාගත හැක.

05. සතියේ වැඩකරන දිනවල සාමාන්‍ය කාර්යාල වේලාව තුළ පැමිණ ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකි අතර, වැඩිදුර විස්තර බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී වෙතින් ලබාගත හැකිය. දූරකථන අංකය **091-4944842,** විද්‍යුත් ලිපිනය baddegamads.acc@gmail.com

06. "**ප්‍රාදේශීය ලේකම්, බද්දේගම**" යන නමින්, ලංසුපත්වල සඳහන් පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් මගින් ලබාගත් රු. 28,000.00 ක වටිනාකමින් යුතු වලංගු ලංසු සුරක්ෂණයක් ලංසුපත් සමග ඉදිරිපත් කළ යුතුය.

07. මුද්‍රා තබන ලද ලංසුපත් **2019.07.12** දින **ප.ව. 2.30** ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බද්දේගම** යන ලිපිනයට යොමු කිරීම හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. අතින් ගෙනවිත් භාරදෙන්නේ නම් අදාළ ලංසුපත් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී නිල කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ඉදිරිපත් කරනු ලබන ලංසුපත් පිටපත් දෙකකින් (මුල් පිටපත හා අනු පිටපත) එවිය යුතු අතර, ඒවා බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවර "**ප්‍රසම්පාදන අංකය හා ජාලගත ශුද්ධ මනුකරණ සූර්ය බල පද්ධති**" යන්න සඳහන් කළ යුතුය. **2019.07.12** දින **ප.ව. 2.30** ට ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදුකරනු ලබන අතර, එම අවස්ථාවේදී ලංසුකරුවන් හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද නියෝජිතයන්ට එයට සහභාගි විය හැකිය. අඩුපාඩු සහිත ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඇප මුදල් ද රාජසන්තක කරනු ලැබේ. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,**
**බද්දේගම.**
**2019.06.25**